# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආගාමික හා විගාමික (සංශෝධන)

**(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින්
2019 සැප්තැම්බර් මස 04 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 ජුනි මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[296 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින්, (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ, වීසා පත්‍රයක කාලසීමාව වැඩි කිරීම සහ අමාත්‍යවරයා විසින් ස්ථිර වාස වීසා පත්‍රයක කාලය නිශ්චය කිරීම පිණිස විධිවිධාන සකස් කිරීම වේ.

එල්. ඩී.— ඕ. 24/2018

**(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

**1.** මේ පනත 2019 අංක  දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

351 වන අධිකාරයේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ “අවුරුදු දෙකක්” යන වචන වෙනුවට “අවුරුදු පහක්” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ “අවුරුදු දෙකක් ඉක්මවන එහෙත් අවුරුදු පහක් නොඉක්මවන” යන වචන වෙනුවට “අවුරුදු පහක් ඉක්මවන එහෙත් අවුරුදු දහයක් නොඉක්මවන” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:–

“(3අ) (අ) (1) වන සහ (2) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාලසීමා කවරක් වුව ද, ස්ථිර වාස වීසා පත්‍රයක කාලය අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ කාර්යය සඳහා “ස්ථිර වාස වීසා පත්‍රයක්” යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ ප්‍රදානය කරන වීසා පත්‍රයක් අදහස් වේ.”.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.